# 25 වීජීය භාග

මෙම පාඩම ඉගෙනීමෙන් ඔබට,

- වීජීය භාග හඳුනා ගැනීම
- හරය සමාන වූ වීජීය භාග එකතු කිරීම
- හරය සමාන වූ වීජීය භාග අඩු කිරීම

යන විෂයය කරුණුවලට අදාළ නිපුණතා කරා එළඹීමට අවස්ථාව ලැබෙනු ඇත.

## 25.1 වීජීය භාග

$\frac{3}{4}$ භාග සංඛ්‍යාවකි. එය ඒකකයක් සමාන කොටස් හතරකට බෙද ඉන් කොටස් තුනක් ගැනීම හෝ හතර දෙනෙකු අතර යම් ද්‍රව්‍යයක් සමව බෙදූ විට තුන්දෙනෙකුට ලැබෙන කොටස හෝ වේ.

$\frac{3}{4}$

| ඒකකයක් සමාන කොටස් හතරකට බෙද ඉන් කොටස් තුනක් ගැනීම | යම් ද්‍රව්‍යයක් හතර දෙනෙකු අතර බෙදූ විට තුන් දෙනෙකුට ලැබෙන කොටස |
|---|---|

ඒ අනුව

- ඒකකයක් සමාන කොටස් හතරකට බෙද ඉන් කොටස් $x$ ප්‍රමාණයක් ගැනීම J $\frac{x}{4}$
- ඒකකයක් සමාන කොටස් $x$ ප්‍රමාණයකට බෙද ඉන් කොටස් හතරක් ගැනීම J $\frac{4}{x}$
- ඒකකයක් සමාන කොටස් $x$ ප්‍රමාණයකට බෙද ඉන් කොටස් $y$ ප්‍රමාණයක් ගැනීම J $\frac{y}{x}$

ලෙස දැක්විය හැකි ය.

එහෙත් ඒවා $\frac{3}{4}$ මෙන් සංඛ්‍යාත්මක අගයන්ගෙන් සමන්විත නොවන නිසා නිශ්චිත අගයක් නොදක්වන භාග වේ. එසේ වන්නේ ඒවායේ $x$ හා $y$ වැනි අඥාත පද ඇතුළත් ව තිබීම නිසයි.

ලවයට හෝ හරයට හෝ ඒ දෙකට ම හෝ අඥාත ඇතුළත් ඉහත ආකාරයේ භාග **වීජීය භාග** ලෙස හැඳින්වේ. වීජීය භාගයක හරයේ හෝ ලවයේ හෝ ඒ දෙකේ ම හෝ වීජීය පදයක් හෝ වීජීය ප්‍රකාශනයක් තිබිය යුතු ය. අඥාතයක් සහිත පදයක් වීජීය පදයක් වන අතර එය ඒක පද වීජීය ප්‍රකාශනයක් ලෙස ද හැඳින්වේ. වීජීය පදයක් තවත් වීජීය පදයක් සමග හෝ සංඛ්‍යා සමග + හෝ - ලකුණෙන් සම්බන්ධ වීමෙන් වීජීය ප්‍රකාශන ලැබේ.


නොමිලේ බෙදා හැරීම පිණිසයි.

### නිදසුන 1

(i) හරය වීජීය පදයක් සහිත වීජීය භාගයක් ලියන්න.
(ii) ලවය වීජීය පදයක් සහිත වීජීය භාගයක් ලියන්න.

(i) $\frac{5}{a}$ (ii) $\frac{p}{2}$

### නිදසුන 2

(i) හරය වීජීය ප්‍රකාශනයක් සහිත වීජීය භාගයක් ලියන්න.
(ii) ලවය වීජීය ප්‍රකාශනයක් සහිත වීජීය භාගයක් ලියන්න.

(i) $\frac{2}{a+2}$ (ii) $\frac{a+3}{5}$

### නිදසුන 3

හරයේ හා ලවයේ වීජීය පද හෝ වීජීය ප්‍රකාශන ඇතුළත් වීජීය භාග හතරක් ලියන්න.

(i) $\frac{a}{a+2}$ (ii) $\frac{x}{a+2}$ (iii) $\frac{5x}{2a-1}$ (iv) $\frac{x-y}{2x+3y}$

## අභ්‍යාසය 25.1

(1) පහත දැක්වෙන භාග අතරින් වීජීය භාග තෝරා ලියන්න.

(i) $\frac{3}{5}$ (ii) $\frac{x}{3}$ (iii) $\frac{a}{x+2}$ (iv) $\frac{1}{4}$ (v) $\frac{5}{p}$ (vi) $\frac{x+3}{x}$

(2) ලවය $a$ වූ වීජීය භාග තුනක් ලියන්න.
(3) හරය $x$ වූ වීජීය භාග තුනක් ලියන්න.
(4) හරය $x$ ඇතුළත් වීජීය ප්‍රකාශනයක් සහිත වීජීය භාග තුනක් ලියන්න.
(5) ලවය $a$ ඇතුළත් වීජීය ප්‍රකාශනයක් සහිත වීජීය භාග තුනක් ලියන්න.

## 25.2 සමාන සංඛ්‍යාමය හර සහිත වීජීය භාග එකතු කිරීම, අඩු කිරීම

සාමාන්‍ය භාග එකතු කිරීමේ දී හා අඩු කිරීමේ දී යොදාගත් නීති යටතේ ම වීජීය භාග එකතු කිරීම හා අඩු කිරීම කරනු ලැබේ.

$$\frac{1}{5}+\frac{1}{5}=\frac{2}{5} \Rightarrow \frac{x}{5}+\frac{x}{5}=\frac{2x}{5}$$

$$\frac{4}{5}-\frac{1}{5}=\frac{3}{5} \Rightarrow \frac{4x}{5}-\frac{x}{5}=\frac{4x-x}{5}=\frac{3x}{5}$$


නොමිලේ බෙදා හැරීම පිණිසයි.

**නිදසුන 4**

$\dfrac{2x}{3} + \dfrac{2x}{3}$ සුළු කරන්න.

$$\frac{2x}{3} + \frac{2x}{3}$$
$$= \frac{2x + 2x}{3}$$
$$= \underline{\underline{\frac{4x}{3}}}$$

**නිදසුන 5**

$\dfrac{5x}{7} - \dfrac{2x}{7}$ සුළු කරන්න.

$$\frac{5x}{7} - \frac{2x}{7}$$
$$= \frac{5x - 2x}{7}$$
$$= \underline{\underline{\frac{3x}{7}}}$$

**නිදසුන 6**

$\dfrac{3x}{10} + \dfrac{2x}{10} - \dfrac{x}{10}$ සුළු කරන්න.

$$\frac{3x}{10} + \frac{2x}{10} - \frac{x}{10}$$
$$= \frac{3x + 2x - x}{10}$$
$$= \frac{4x}{10}$$
$$= \underline{\underline{\frac{2x}{5}}}$$ (පිළිතුර සරල ම ආකාරයෙන් දැක්වීම)

**නිදසුන 7**

$\dfrac{9x}{13} - \dfrac{2x}{13} - \dfrac{6x}{13}$ සුළු කරන්න.

$$\frac{9x}{13} - \frac{2x}{13} - \frac{6x}{13}$$
$$= \frac{9x - 2x - 6x}{13}$$
$$= \underline{\underline{\frac{x}{13}}}$$

## අභ්‍යාසය 25.2

සුළු කරන්න. (පිළිතුර සරල ම ආකාරයෙන් දක්වන්න.)

(i) $\dfrac{a}{3} + \dfrac{a}{3}$ (ii) $\dfrac{2x}{5} + \dfrac{x}{5}$ (iii) $\dfrac{3x}{4} + \dfrac{2x}{4}$

(iv) $\dfrac{5x}{6} + \dfrac{5x}{6} + \dfrac{x}{6}$ (v) $\dfrac{2x}{3} - \dfrac{x}{3}$ (vi) $\dfrac{3a}{7} - \dfrac{a}{7}$

(vii) $\dfrac{3p}{10} - \dfrac{p}{10}$ (viii) $\dfrac{3x}{7} + \dfrac{2x}{7} - \dfrac{x}{7}$ (ix) $\dfrac{3a}{4} - \dfrac{a}{4} + \dfrac{5a}{4}$

(x) $\dfrac{5x}{7} + \dfrac{2x}{7} - \dfrac{3x}{7}$ (xii) $\dfrac{5x}{9} - \dfrac{2x}{9} - \dfrac{x}{9}$ (xii) $\dfrac{6x}{11} - \dfrac{x}{11} - \dfrac{2x}{11}$



නොමිලේ බෙදා හැරීම පිණිසයි.

## 25.3 හරයේ සමාන වීජීය පදයක් ඇති වීජීය භාග එකතු කිරීම හා අඩු කිරීම

**නිදසුන 8**

$\dfrac{5}{x} + \dfrac{3}{x}$ සුළු කරන්න.

$$\frac{5}{x} + \frac{3}{x}$$

$$= \frac{5+3}{x}$$

$$= \underline{\underline{\frac{8}{x}}}$$

**නිදසුන 9**

$\dfrac{2}{5a} + \dfrac{7}{5a}$

$$\frac{2}{5a} + \frac{7}{5a}$$

$$= \frac{2+7}{5a}$$

$$= \underline{\underline{\frac{9}{5a}}}$$

**නිදසුන 10**

$\dfrac{8}{3x} - \dfrac{2}{3x}$ සුළු කරන්න.

$$\frac{8}{3x} - \frac{2}{3x}$$

$$= \frac{8-2}{3x}$$

$$= \frac{\cancel{6}^{\,2}}{{}_{1}\cancel{3}x}$$

$$= \underline{\underline{\frac{2}{x}}}$$

### අභ්‍යාසය 25.3

සුළු කරන්න. (පිළිතුර සරල ම ආකාරයෙන් දක්වන්න.)

| | | |
|---|---|---|
| (i) $\dfrac{3}{a} + \dfrac{3}{a}$ | (ii) $\dfrac{5}{x} + \dfrac{2}{x}$ | (iii) $\dfrac{7}{3a} + \dfrac{2}{3a}$ |
| (iv) $\dfrac{5}{p} + \dfrac{2}{p} + \dfrac{3}{p}$ | (v) $\dfrac{3}{x} - \dfrac{1}{x}$ | (vi) $\dfrac{7}{3a} - \dfrac{2}{3a}$ |
| (vii) $\dfrac{7}{10P} - \dfrac{2}{10P}$ | (viii) $\dfrac{3}{2x} + \dfrac{5}{2x} - \dfrac{1}{2x}$ | (ix) $\dfrac{1}{2m} + \dfrac{3}{2m} - \dfrac{1}{2m}$ |
| (x) $\dfrac{5}{x} - \dfrac{2}{x} + \dfrac{3}{x}$ | (xi) $\dfrac{6}{y} - \dfrac{1}{y} - \dfrac{4}{y}$ | (xii) $\dfrac{6}{7b} - \dfrac{3}{7b} - \dfrac{2}{7b}$ |

## 25.4 හරයේ සමාන වීජීය ප්‍රකාශන ඇති වීජීය භාග එකතු කිරීම, අඩු කිරීම

**නිදසුන 11**

(i) $\dfrac{2}{x+2} + \dfrac{3}{x+2}$ සුළු කරන්න.

$$\frac{2}{x+2} + \frac{3}{x+2} = \frac{2+3}{x+2} = \underline{\underline{\frac{5}{x+2}}}$$

**නිදසුන 12**

(ii) $\frac{5}{a-5} - \frac{2}{a-5}$ සුළු කරන්න.

$$\frac{5}{a-5} - \frac{2}{a-5} = \frac{5-2}{a-5} = \underline{\underline{\frac{3}{a-5}}}$$

**නිදසුන 13**

සුළු කරන්න

(i) $\frac{5}{2x+3} + \frac{2}{2x+3} - \frac{1}{2x+3}$

$$\frac{5}{2x+3} + \frac{2}{2x+3} - \frac{1}{2x+3}$$

$$= \frac{5+2-1}{2x+3}$$

$$= \underline{\underline{\frac{6}{2x+3}}}$$

(ii) $\frac{8}{3p+5} - \frac{1}{3p+5} - \frac{2}{3p+5}$

$$\frac{8}{3p+5} - \frac{1}{3p+5} - \frac{2}{3p+5}$$

$$= \frac{8-1-2}{3p+5}$$

$$= \underline{\underline{\frac{5}{3p+5}}}$$

## අභ්‍යාසය 25.4

සුළු කරන්න.

(i) $\frac{3}{x+1} + \frac{2}{x+1}$

(ii) $\frac{5}{a+2} + \frac{3}{a+2}$

(iii) $\frac{7}{p+3} + \frac{2}{p+3}$

(iv) $\frac{3}{x+4} + \frac{2}{x+4} + \frac{1}{x+4}$

(v) $\frac{5}{a+2} - \frac{1}{a+2}$

(vi) $\frac{7}{x-1} - \frac{2}{x-1}$

(vii) $\frac{5}{2a+1} - \frac{3}{2a+1}$

(viii) $\frac{3}{x+2} + \frac{5}{x+2} - \frac{1}{x+2}$

(ix) $\frac{1}{a+5} + \frac{5}{a+5} - \frac{2}{a+5}$

(x) $\frac{3}{3x+2} - \frac{1}{3x+2} + \frac{4}{3x+2}$


නොමිලේ බෙදා හැරීම පිණිසයි.

## 25.5 හරයේ සමාන සංඛ්‍යා හා ලවයේ වීජීය ප්‍රකාශන ඇති වීජීය භාග එකතු කිරීම අඩු කිරීම

**නිදසුන 14**

$\dfrac{x+2}{5} + \dfrac{x}{5}$ සුළු කරන්න.

$$\dfrac{x+2}{5} + \dfrac{x}{5}$$

$$= \dfrac{x+2+x}{5}$$

$$= \dfrac{2x+2}{5}$$

**නිදසුන 15**

$\dfrac{a+3}{5} + \dfrac{a+1}{5}$ සුළු කරන්න.

$$\dfrac{a+3}{5} + \dfrac{a+1}{5}$$

$$= \dfrac{a+3+a+1}{5}$$

$$= \dfrac{2a+4}{5}$$

**නිදසුන 16**

$\dfrac{2x+3}{5} - \dfrac{x-2}{5}$ සුළු කරන්න.

$$= \dfrac{2x+3}{5} - \dfrac{x-2}{5}$$

$$= \dfrac{2x+3}{5} - \dfrac{x-2}{5}$$

$$= \dfrac{2x+3-(x-2)}{5}$$ (මෙම අඩු කිරීමේ දී වරහන් යෙදීම අනිවාර්යය වේ.)

$$= \dfrac{2x+3-x+2}{5}$$ (වරහන් ඉවත් කිරීම සඳහා වරහනට පිටතින් වූ 1න් ගුණකිරීම.)

$$= \dfrac{x+5}{5}$$

### අභ්‍යාසය 25.5

(1) සුළු කරන්න.

(i) $\dfrac{x+3}{5} + \dfrac{x+1}{5}$ (ii) $\dfrac{2a+5}{7} + \dfrac{a}{7}$ (iii) $\dfrac{3p-3}{4} + \dfrac{3p}{4}$

(iv) $\dfrac{x+2}{6} + \dfrac{5}{6} + \dfrac{x-1}{6}$ (v) $\dfrac{7a+5}{2} - \dfrac{a}{2}$ (vi) $\dfrac{3p+2}{3} - \dfrac{p}{3}$

(vii) $\dfrac{3x+1}{5} - \dfrac{x+1}{5}$ (viii) $\dfrac{2a+3}{10} - \dfrac{a-1}{10}$

(ix) $\dfrac{3x+2}{5} + \dfrac{x+3}{5} - \dfrac{x+2}{5}$

(x) $\dfrac{x}{6} + \dfrac{x+2}{6} - \dfrac{x+1}{6}$

(2) සුළු කරන්න.

(i) $\dfrac{a+3}{a+2} + \dfrac{a}{a+2}$

(ii) $\dfrac{3p+2}{a+1} + \dfrac{p-q}{a+1}$

(iii) $\dfrac{3a-1}{x+y} + \dfrac{a}{x+y}$

(iv) $\dfrac{5-a}{x-3} - \dfrac{2a+1}{x-3}$

(v) $\dfrac{2a+1}{x+y} + \dfrac{3a-2}{x+y}$

(vi) $\dfrac{5x+3}{2a-b} - \dfrac{2x-1}{2a-b}$